මාවතගම ප්‍රාදේශීය සභාව
---------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 26 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 29 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 සැප්තැම්බර් 12 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මාවතගම ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, සභාපතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට මාවතගම ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු ව්‍යාපෘතිය යටතේ පිළිසරු ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති ගොඩනැගිල්ල ඉදිකිරීම හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා 20% ක අත්තිකාරම් මුදල ලෙස ලැබී තිබූ රු.1,214,031 ක් සමාලෝචිත වර්ෂය තුල උක්ත ව්‍යාපෘතීන් සඳහා වැයකර නොතිබුනද එම වටිනාකම ණයහිමියන් ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

(ආ). මගනැගුම ව්‍යාපෘතිය යටතේ කර්මාන්ත 2 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතුව හා ගෙවිය යුතුව තිබූ රු.997,198 ක් හා ගමනැගුම අවිච්ඡේද කර්මාන්ත 12 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතුව හා ගෙවිය යුතුව තිබූ රු.4,296,696 ක් සමාලෝචිත වර්ෂයේදී ගිණුම්වල දක්වා නොතිබුණි.

1.3.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.10,016,329 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු2,416,591 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.621,830 ක් විය.

2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ). සේවක අර්ථසාධක අරමුදලෙන් අවස්ථා 2 කදී ලද රු.185,000 ක මුදලක් ද අවස්ථා 4 කදී විවිධ කටයුතු සඳහා සභාවට ලැබී තිබූ රු.190,000 ක්ද, අවස්ථා 5 කදී වැටුප් ලෙස ගෙවිය යුතු රු.48,090 ක මුදලක්ද, අදාල කාර්යයන් සඳහා නොයොදා සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ). සභාව විසින් පවත්වාගෙන ගිය ජල අංශය 2011 වර්ෂය ආරම්භයේදී ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට භාරදී තිබූ අතර ඒ වන විට ගිණුම් විෂයයන් 5 ක් යටතේ ලැබිය යුතුව තිබූ රු.1,119,540 ක්ද, ගිණුම් විෂයයන් 3 යටතේ ගෙවිය යුතුව තිබූ රු.800,436 ක්ද නිරවුල් නොකර සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම්වල දක්වා තිබුණි. එමෙන්ම ජල අංශයට අදාල තැන්පතු වර්ග 5 ක් යටතේ පැවති රු.5,182,440 ක තැන්පතු ශේෂයන් දීර්ඝ කාලයක සිට පැවත එන අතර එම ශේෂයන්ද නිරවුල් නොකර සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ). ගිණුම් විෂයයන් 4 ක් යටතේ දීර්ඝ කාලයක සිට පවතින රු.1,928,297 ක හර ශේෂයන්ද ගිණුම් විෂයයන් 3 ක් යටතේ පවතින රු.19,855 ක බැර ශේෂයන්ද නිරවුල් නොකර සමාලෝචිත වර්ෂය අවසානයටද ගිණුම් වලට ගෙන තිබුණි.

(ඈ) සභාව විසින් පවත්වා තිබූ කොන්ක්‍රීට් ව්‍යාපෘතිය නිමවී වසර 3 ක් ගත වුවද, අයවීම හිඟහිට ඇති රු.17,292 ක ණයගැති ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය තෙක්ම පැවතුණි. සමාලෝචිත වර්ෂය අවසානයට තොගය ලෙස දක්වා තිබූ රු.282,239 තුල දීර්ඝ කාලයක සිට පැවත එන රු.74,568 ක ජල කර්මාන්ත ගබඩා ශේෂයක් හා රු.31,428 ක් වටිනා කොන්ක්‍රීට් නිමි තොග ශේෂයක් ඇතුලත්ව තිබුණි. සංවර්ධන සභා පැවති කාලයේ සිට පැවත එන අක්‍රීය ජංගම බැංකු ගිණුම් 4 ක පැවති රු.48,455 ක මුදල් ශේෂය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කර නොතිබුණි.

(ඉ) බැංකු ගිණුම් 02 ක ට අදාලව නිකුත් කල නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ රු. 242,822 ක් වටිනා චෙක්පත් 43 ක් පැවතුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇසතමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු000' | රු.000' | රු.000' |
| (i). | වරිපනම් හා බදු | 1,734 | 1,442 | 4,197 |
| (ii). | බදුකුලී | 3,181 | 3,380 | 1,503 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 1,000 | 924 | 94 |
| (iv). | වෙනත් ආදායම් | 57 | 47 | 1,052 |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ මුදල රු.1,061,850 ක් විය.

2.3.3 කඩකුලී

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂය අවසානයට රු.545,246 ක කඩකුලී හිඟයක් පැවතිණි. ඒ තුල මාසික කුලිය රු.92 ක් වූ පදික කඩ 5 ක් වෙනුවෙන් අවුරුදු 1 ත් 10 ත් අතර කාල පරාසයක රු.25,396 ක හිඟයක් හා පොදු වෙළඳපලෙහි කඩ කාමර 42 න් 17 කට අදාලව මාස 9 ත් අවුරුදු 4 ත් අතර කාලපරාසයක වූ රු.375,967 ක හිඟයක් සම්බන්ධයෙන් සහ සභා දේපල 9 කට අදාලව 1982-1986 කාලයට අදාලව පැවති රු.30,313 ක හිඟයක් අයකිරීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(ආ). අවම ලංසුව රු.18,341 ක් වූ සභාව සතු දේපල 14 ක් 2010 වර්ෂයේ සිට ගැණුම්කරුවන් ඉදිරිපත් නොවීම හේතුවෙන් බදුදීමට නොහැකි වී තිබුණ අතර දේපල වත්කම් ආදායම් ලේඛනයේ 1987 සිට පැවත එන රු.397,051 ක හිඟය සම්බන්ධයෙන් අදාල විස්තර හඳුනාගත නොහැකි වූ අතර ඒ පිළිබඳ අවශ්‍ය පියවර ගෙනද නොතිබුණි.

2.3.4 බදු කුලී.

සිනමා ශාලාවකින් 1989 වර්ෂයේ සිට බදුකුලී වශයෙන් රු. 1,008,967 ක් ලැබිය යුතුව තිබුණි.

2.3.5 බස් නැවතුම් පොල ගාස්තු

2004 වර්ෂයට පෙර සිට පැවත එන බස්නැවතුම්පල ගාස්තු වශයෙන් රු.54,940 ක් ලැබිය යුතුව තිබුණි.

2.3.6 <u>වෙළඳ බලපත ගාස්තු</u>

සමාලෝචිත වර්ෂය අවසානයට රු.84,500 ක වෙළඳ බලපත්‍ර ගාස්තු හිඟයක් පවතින අතර එය වර්ෂ කිහිපයකට පෙර අයවැයගත වෙළඳ බලපත්‍ර ආදායම බිල්කිරීමෙන් පැන නැගුන හිඟයක් බව දක්වා තිබුණි.

2.4 <u>ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>

දීර්ඝ කාලයක සිට පැවත එමින් තිබූ රු.28,040 ක කොන්ක්‍රීට් අමුද්‍රව්‍ය තොග ශේෂයක් විධිමත් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුල ජනල් සටහන් අංක 79 මගින් කපාහැර තිබුණි.

2.5 <u>අවිධිමත් ගනුදෙනු</u>

සමාලෝචිත වර්ෂයේ මාවතගම ට්‍රයිස්ටාර් ගාමන්ට් නැමති ඉඩම පුද්ගලික ආයතනයක් මගින් කට්ටිකර විකිණීම ආරම්භ කර තිබුණි. 2003 නොවැම්බර් 28 දිනැති අංක 1317 ගැසට් පත්‍රයේ පලකල අතුරු ව්‍යවස්ථාවේ 16(1) වගන්තිය ප්‍රකාරව වයඹ පළාතේ පර්පාලන බල සීමාව තුල නිවාස හා දේපල සංවර්ධනය හා ඉඩම් කට්ටිකිරීමට අදාල ආයතන හා පුද්ගලයන් වයඹ පළාත් සභාවේ ලියාපදිංචි විය යුතු වුවද, යථෝක්ත ආතනය ඒ අනුව කටයුතු කර නොතිබූ අතර සභාවට අයවිය යුතු බදු මුදලින් රු.200,500 ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට අයවීමට තිබුණි. " හිඟ මුදල අයකර ගැනීමට අධිකරණ ක්‍රියාමාර්ග ගන්නා බව " සභාපතිවරයා 2012 ජනවාර මාසයේදී මා වෙත වාර්තා කර තිබුණි.

2.6 <u>මානව සම්පත් කළමනාකරණය</u>

පහත නිරීකෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂය වන විට සභාවේ ලේකම්තනතුර පුරප්පාඩු වී තිබූ අතර, පළාත් පාලන නිලධාරිවරයකු තනතුරේ වැඩ ආවරණය කර තිබුණි. සභාවේ අනුමත පුස්තකාලයාධිපති තනතුරු 2 සමාලෝචිත වර්ෂය අවසන් වන විට පුරප්පාඩුව පැවති අතර අනුමත පුස්තකාල සහායක සංඛ්‍යාව 2 ක් වවද, 7 දෙනෙකු සේවයේ නියුක්තව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට විවිධ තනතුරු නාම 8 යටතේ සේවකයන් 12 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර සේවකයන් 4 දෙනෙකුට බඳවාගත් තනතුරින් බැහැරව වෙනත් තනතුරු වල රාජකාරි පවරා තිබුණි.

(ආ). කම්කරු, මුරකරු රියදුරු වැනි තනතුරු නාම යටතේ අනුමත ප්‍රමාණය 36 ක් වුවද, සමාලෝචිත වර්ෂය අවසානයට 31 දෙනෙකු පමණක් සේවයේ යොදවා තිබුණි. එහෙත් සභා අරමුදලින් වැටුප් ගෙවීමේ පදනම මත එකී තනතුරු නාම සඳහා 21 දෙනෙකු අනියම් / ආදේශක පදනම මත සමාලෝචිත වර්ෂය අවසන් වන විට බඳවා ගෙන තිබුණි.

(ඇ). සභාවෙන් වැටුප් ගෙවීමේ පදනම මත බඳවාගෙන තිබූ ආදේශක සේවකයින් 52 ගෙන් 15 දෙනෙකුට පත්වීම් ලිපි නිකුත් කර නොතිබුණි. මාර්ග කම්කරු අධීක්ෂණ හා බස්නැවතුම්පල භාරකරු තනතුරු 2 ක් සඳහා 3 දෙනෙකු සේවයේ යොදවා තිබුණද මෙම තනතුරු 2 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවාගෙන නොතිබුණි. ආදාහනාගාර ක්‍රියාකරු හා ආදාහනාගාර කම්කරු තනතුරු සමාලෝචිත

වර්ෂයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරගෙන තිබුණද අදාල තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු නොකර සභාවේ කම්කරුවන් දෙදෙනෙකු මගින් මෙම කාර්ය ඉටුකරගෙන තිබුණි.

2.7 සේවක ණය

මාර්ග කම්කරුවෙකු ලෙස සේවය කර 2008 වර්ෂයේදී මිය ගිය සේවකයකුගෙන් අයවිය යුතු රු.13,380 ක ණය ශේෂය සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම නිරවුල් කර නොතිබුණි. සභාවේ සේවයේ නියුතු දෛනික කාර්ය මණ්ඩලයේ 19 දෙනෙකු වෙත 2010 හා 2011 වර්ෂයේදී ලබාදී තිබූ ණය මුදල් වලින් රු.38,687 ක් ඔවුන් සේවයට නොපැමිණීම හේතුවෙන් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. සභාවට අයත්ව පැවති ජල ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේදී අදාල නිලධාරීන්ද සමඟ ජල පවාහන මණ්ඩලයට පවරා දී තිබුණද, ජල අංශයේ සේවකයන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.93,750 වූ ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කර නොතිබුණි.

2.8. මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයින්ට අදාලව සභාව විසින් එකී අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු.3,134,064 ව තිබුණි.

(ආ) 2010 ජුනි 28 දින පැවති අබලි භාණ්ඩ වෙන්දේසිය සඳහා භාණ්ඩ වර්ග 71 ක් ඉදිරිපත් කිරීමට තිබූ අතර එයින් භාණ්ඩ වර්ග 8 ක් යටතේ ඒකක 57 ක් වෙන්දේසියට ඉදිරිපත් නොවුණි. මෙම භාණ්ඩ ගබඩාවේ නොතිබුණු අතර එකී භාණ්ඩවල වටිනාකම්ද හඳුනාගත නොහැකි වී තිබුණි. " පළාත් පාලන කොමසාරිස් විසින් මෙහි සඳහන් රු.39,660 ක් වටිනා සිමෙන්ති ගල් යන්ත්‍රය පිළිබඳ පමණක් පරීක්ෂණයක් කරන බව " සභාපතිවරයා 2012 ජනවාරි මාසයේදී මා වෙත දන්වා තිබුණි.

(ඇ). සභාවට අයත් කැබ්රථයක් 1995 වර්ෂයේදී යුධහමුදාවට භාරදී 2006 සැප්තැම්බර් 20 දින සභාව වෙත ආපසු භාරදී තිබුණි. වයඹ පළාත් පාලන කොමසාරිස්ගේ 2007 මැයි 07 දිනැති අංක 12/1/පා/පොදු2007 දරණ ලිපියෙන් මෙම වාහනයේ වටිනාකම රු.115,000 කට තක්සේරු කර වාහනයේ අයිතිය වෙනස්කිරීම සඳහා ප්‍රධාන ලේකම් විසින් 2007 දෙසැම්බර් 13 සභාවට දන්වා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයිතිය සභාවට පවරාගෙන වෙන්දේසි කිරීමට කටයුතු නොකර අනාරක්ෂිතව සභාවේ ගාල්කර තිබුණි.

(ඈ). ආයතනයට අදාලව සංයුක්ත සැළැස්මක් හා සමාලෝචිත වර්ෂයට ක්‍රියාකාර සැළැස්මක් පිළියෙල කර නොතිබුණි.

2.9 <u>අභ්‍යන්තර විගණනය</u>

සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුව නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමණාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය